# සිංහල ලේඛන කලාව



සෙනරත් වික්‍රමසිංහ

# සිංහල ලේඛන කලාවේ විකාශනය

ලේඛනය සඳහා අවශ්‍ය ප්‍රධාන සංඝටකය වන්නේ අක්ෂර මාලාවයි. දැනට ලැබී ඇති සාධක අනුව ශ්‍රී ලාංකිකයින් විසින් ලේඛනය ආරම්භ කරන ලද්දේ මහින්දාගමනයත් සමඟ ක්‍රි: පූ: 3 වන සියවසේ දී පමණ බව සාමාන්‍ය පිළිගැනීමයි. එසේ වුවත්, යටත් පිරිසෙයින් බුදුසමය පැමිණීමට ශතවර්ෂ කිහිපයකට එපිට කාල වකවානුවක මෙරටෙහි අක්ෂර භාවිත කොට ලිවීමේ ක්‍රමයක් වූ බවට අනුමාන කළ හැකි සාක්ෂි තිබේ. පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් ඉබ්බන්කටුව, යටිගල්පොත්ත යන ස්ථානවල සුසානවලින් හමු වූ සංකේත ( ක්‍රි. පූ. 8 - 4 ) අනුරාධපුර ඇතුළුනුවර ගෙඩිගේ කැණීම්වලින් හමු වූ වළං කැබලිවල දක්නට ලැබෙන සංකේත (ක්‍රි. පූ. 5 වන සියවස) සහ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් බ්‍රාහ්මී ලේඛනවල දක්නට ලැබෙන බ්‍රාහ්මී නොවන සංකේත මේ බව තහවුරු කිරීමට ඇති වැදගත් පුරාවිද්‍යාත්මක සාක්ෂි වේ.




***බ්‍රාහ්මී නොවන සංකේත* - Paranavitanas - 1970**